// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2161/34 - 2020 පෙබරවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

5 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම,

> 2019 සැප්තැම්බර් මස 30 දිනැති අංක 2143/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ උපලේඛනය මගින් දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 03.02 සහ 03.03 යටතට වැටෙන මාළු (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් හැර) ආනයනය සඳහා අදාළ වන 10% හෝ කිලෝ ග්‍රෑමයකට රු. 100 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු. 25 ක් අයකරගෙන ඉතිරි වටිනාකම අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

මෙම නියමය අනුව මාළු (සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 03.02 සහ 03.03 යටතට වැටෙන මාළු, (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් හැර) ආනයනය සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රු. 25 ක් ලෙස, 2020 පෙබරවාරි මස 07 වැනි දින සිට ආරම්භ වන මාස 03 කාල සීමාවක් තුළදී අයකර ගත යුතු ය.

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 06 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

02 - 453

1A - PG 4868 — 567 (2020/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*